කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# නාට්‍ය හා රංගකලාව

## නාට්‍ය නිර්මාණය හා විචාරය DMAT - E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01 "එකම නාට්‍ය පිටපත උපයෝගී කරගත්තද, අධ්‍යක්ෂවරයා හා නළුනිළියන් වෙනස් වුවහොත් එම පිටපතෙන් බිහිවන නාට්‍ය නිර්මාණයේ ස්වරූපය හා අර්ථකථනය වෙනස්වීටම ඉඩ ඇත." එසේ වීමට හේතු පැහැදිලි කරන්න.

02. වේදිකා නාට්‍ය නිර්මාණයක් සඳහා සම්බන්ධ වන අංග රචනා ශිල්පියකු විසින් අවධානයට ගතයුතු කාරණා පිළිබඳ විමසීමක් කරන්න.

03. රූපණය යනු කුමක්දැයි නිර්වචනය කොට නාට්‍යවල දක්නට ලැබෙන විවිධ රූපණ ශෛලීන් පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. රංගාලෝකය සඳහා වර්තමානයේදී භාවිතා කෙරෙන විදුලි පහන් වර්ග හා උපකරණ නම් කොට, ඒවා නාට්‍යකට නිර්මාණාත්මකව යොදාගෙන ඇති ආකාරය ඔබ දන්නා උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

05. නළුවාගේ බාහිර සමාරෝපය මතුකර දැක්වීමට වේෂභූෂණ ඉවහල් වන ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කොට, වේෂභූෂණ සැකසීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු මොනවා දැයි විස්තර කරන්න.

06. "නාට්‍ය රචකයා මැවූ චරිතවලට නළුනිළියන් මාර්ගයෙන් ජීවන හුස්ම පිඹින්නේ අධ්‍යක්ෂවරයාය". නාට්‍ය අධ්‍යක්ෂකවරයාගේ කාර්යභාරය සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

07. නාට්‍යයකට සංගීතය සැපයීමේදී සංගීත අධ්‍යක්ෂවරයා විසින් සැලකිලිමත් වියයුතු කාරණා මොනවාදැයි සාකච්ඡා කරන්න.

08. කලාත්මක තෘප්තිය යනු කුමක්දැයි පැහැදිලි කොට, නාට්‍ය නැරඹීමේදී ප්‍රේක්ෂකයන් තුළ ජනිත විය හැකි කලාත්මක නොවන අනෙකුත් තෘප්තීන් පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. තේමාව, ශෛලිය, චරිත නිරූපණය හා ආනුෂංගික අංශ ගැන අවධානය යොමු කරමින් මෑතක දී ඔබ නැරඹූ නාට්‍යයක් පිළිබඳ විචාරයක් ලියන්න.

***************************